

# මානව පවුල පිළිබඳ මාක්ස්වාදී ප්‍රවේශය

ෆ්‍රෙඩ්රික් එංගල්ස්, කාල් මාක්ස් වැනි අය මාක්ස්වාදයේ ප්‍රධාන විද්‍යාඥයන් වේ. මාක්ස්ගේ සමාජ පරිණාමය පිළිබඳ න්‍යාය නම් මිනිසාගේ ආර්ථික සම්බන්ධතාවන්හි ප්‍රතිඵලයක් ලෙස මෙම සමාජය නිර්මාණය වූවා යන්න යි. මෙම ආර්ථික අධෝ ව්‍යුහය මත සමාජයේ අන් සියලු දේ නිර්මාණය වේ. සෑම විටම සමාජ කණ්ඩායම් දෙකක් අතර ගැටීමක් පවතී. මේ නිසා සමාජය ඉදිරියට ම ගලා යයි. මාක්ස්වාදීන් වැඩිපුර විග්‍රහයට ලක් කළේ පන්ති ගැටුම අතර පවතින බෙදීමයි. කෘත්‍යවාදීන් තර්ක කරන්නේ තිබෙන සමාජය සාධාරණීකරණය කළ යුතු ය යන්නයි. ඔවුන් පවසන්නේ මෙම සමාජ තත්වය වෙනස් කළ යුතු බවයි. ඔවුන් තව දුරටත් පවසන්නේ පුද්ගලයා නිෂ්පාදන සාධකවලට සම්බන්ධ වී සිටින ආකාරයට අනුව මෙම පන්ති ක්‍රම බිහිවන බවයි. මානව පවුල කටයුතු කරන්නේ නිෂ්පාදන සාධක හිමි, නිෂ්පාදන සාධක පාලනය කරන්නන්ගේ අවශ්‍යතාවලට ගැළපෙන ආකාරයට බව දක්වයි.

තවද ඔවුන්

**"කම්කරුවා දවසේ මෙහෙවරින් පීඩා වූවාට පසු නැවතත් ප්‍රකෘතිමත් ව සේවා ස්ථානයට යවන්නේ පවුලයි."** ලෙසින් මානව පවුල අර්ථ දක්වයි.

මාක්ස්වාදීන් දක්වනුයේ පවුල යනු පන්තිමය ආයුධයක් බවයි. ෆ්‍රෙඩ්රික් එංගල්ස් "The origin of the family private property and the state (1884)" නම් ග්‍රන්ථයේ පැහැදිලි ව තර්ක කරන්නේ දේපළ යන සංකල්පය පහළ වන්නට පෙර පවුල හෝ විවාහයක් පැවතියේ නැත යන්නයි. දේපළ අවශ්‍යතාව මත ඒක විවාහය ඇති විය. ඒක විවාහය තුළ දේපළ බෙදී යාම පැහැදිලි ය. එසේ ම කාන්තාව පවුල තුළ ගොදුරක් බවට පත් වූයේ කෙසේද යන්න දක්වා ඇත. මානව පවුල තුළ අසමාන වූ බල සබඳතාව පිළිබඳ සාකච්ඡා කරයි. භාර්යාව පළමු ගෘහ සේවිකාව වන බව එංගල්ස් දක්වයි. රජය තමන්ගේ නිලධාරිවාදී යන්ත්‍රය තුළින්, පවුල තුළ පවතින විවාහයට නෛතික පසුබිමක් සපයයි. එම නෛතික පසුබිම තුළ මේ අසාධාරණය තවදුරටත් ක්‍රියාත්මක වේ. යමෙක් මානව පවුල ජීව විද්‍යාත්මක වශයෙන් තීරණය වූ දෙයක්ය සිතනවා නම් එයට පදනමක් නොමැති බව මාක්ස්වාදීන් පවසයි. මානව පවුල ස්වාභාවික දෙයක් නොවන බවද ඔහු දක්වයි.

මාක්ස්වාදී අදහස්වලට දායක වූ තවත් අයෙක් නම් Zaretsky (1976) ය. ඔහු දක්වන්නේ පවුල තව දුරටත් සේවය සපයන්නේ ධනවාදයට බව ය. ඒ කෙසේද යත් ධනවාදය නිසා දැඩි පීඩනයකට පත් වන පිරිසකට චිත්තවේගමය ආරක්ෂාව සපයන්නේ පවුල මගිනි. තව ද මානව පවුල අප ඉදිරියේ යම් මායාවක් නිර්මාණය කරන බව දක්වයි. මානව පවුල පුද්ගල අවකාශයක් නොවේ. මානව පවුල තුළ ඇති ක්‍රියාකාරකම් රජයේ නීතිරීතිවලට අනුව පාලනය වේ. මානව පවුල තුළ පවතින්නේ ළයාන්විත කිට්ටු සබඳතාවක් ද යන්න ගැටළුවකි. මන්ද මානව පවුල තුළ ද සූරාකෑම, පවුල් ආරවුල් වැනි දේ සිදු වන හෙයිනි. ධනවාදය යන කටුක යථාර්ථය තුළ තවත් එක් දවසක් ජීවත්වීමට මානව පවුල ඉඩ සලසයි.



මාක්ස්වාදය පිළිබඳ අදහස් දැක්වූ තවත් පුද්ගලයන් දෙදෙනෙකු ලෙස Althusser (අල්තුසර් - 1971) සහ poulantzas (1980) දැක්විය හැකි ය. ඔවුන් දක්වන්නේ ධනවාදී සමාජයක් තුළ ඔවුන්ගේ බලය හා පාලනය කිරීම දෙයාකාරයකට සිදු වන බව යි.

**1) මර්දනකාරී රාජ්‍ය තන්ත්‍රය**

රජය සෑම විට ම යම් සමාජයක සිටින සාමාන්‍ය ජනතාව මර්දනය කරයි. ඒ දඬුවම් පැනවීමෙන්, රාජ්‍ය හමුදා මගින්, වැනි දෙයින් ය. මෙය නීතිමය ප්‍රචණ්ඩත්වය යි.

**2) මතවාදමය රාජ්‍ය තන්ත්‍රය**

රජයක් තමන්ට අවශ්‍ය මතවාදය හොඳින් හෝ නරකින් ජනතාව මත පටවයි. රජයට අවශ්‍ය ප්‍රතිපත්ති වටිනාකම්වලට අවශ්‍ය ආකාරයට මිනිසුන් පාලනය කිරීමට උත්සහ ගනී.

ධනවාදී සමාජය සෑම විටම උත්සහ කරන්නේ තිබෙන සමාජය සාධාරණීකරණය කිරීමට යි.

එමෙන්ම දරුවන් ධනවාදී සමාජ ක්‍රමයට හුරු කිරීමෙන් අනතුරුව සමාජයට ඇතුළත් කරනු ලබන්නේ ද පවුල් ඒකකය යි' මහාචාර්ය Jacques Donzelot බොහෝ සෙයින් ම බටහිර පශ්චාත් නූතනවාදී දාර්ශනිකයෙකු වන ෆූකෝගේ ආභාසය ලද කෙනෙකි. ඔහු දක්වන ආකාරයට මානව පවුල කිසිසේත් ම පුද්ගලික අවකාශයක් නොවේ. එය සංකීර්ණ වූ බල සම්බන්ධතා ජාලයක් මගින් පාලනය වන්නකි. සමාජයක සීමිත ප්‍රභූන්, වෘත්තිකයන් වැනි පාර්ශවයන් විසින් නිර්මාණය කරනා ප්‍රවාදයන් විසින් පුද්ගලයන් මෙන් ම පවුල පාලනය වේ. තවත් ලෙසකින් කිවහොත් සමාජයක බලවත් පිරිස් විසින් නිර්මාණය කරන ලද පාලකයන්ට නතු වන දෙයක් ලෙස පවුල හඳුන්වයි.

**ආර්. එම්. සී. ජයමිණි**